**ශීර්ෂය 319 - සබරගමුව පළාත් සභාව**
**-----------------------------------------**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**
**-----------------------------------**

**1.1 දැක්ම**
**------**

සබරගමුව අනභිබවනීයත්වයට

**1.2 මෙහෙවර**
**-----------**

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියලුම සම්පත් ඵලදායීව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙරගමනකට.

**1.3 කාර්යභාරය**
**-------------**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**
**------------------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**
**-----------------------------**

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 25,450.14 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 24,151.29 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන. 1,298.85 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.10 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | **2018 දෙසැම්බර් 31 දිනට** | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 21,828.49 | 21,828.49 | - | - |
| මූලධන | 3,621.65 | 2,322.80 | 1,298.85 | 35.86 |
| එකතුව | **25,450.14** | **24,151.29** | **1,298.85** | **5.10** |

**3. විගණන නිරීක්ෂණය**
**--------------------**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.